සැ. යු. — 2014.11.21 දින පළ වූ අංක 1,890 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,891 - 2014 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2014.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1930 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ/නේවාසික/කෘෂිකාර්මික කටයුතු සඳහා අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබූවන් සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ වූ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලබා දීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට අඹන්පොල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2015 ජනවාරි මස 15 වැනි දින පෙ. ව. 10.00 ට අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) ඉඩම්වල නම් :

(ආ) ඉඩම්වල මැනුම් විස්තර : අ.ග.පි. 115, 142, 143, 144, 160, 161, 3177, 3178, 3207, 3260, 3261, 3622, 3709, 3710, 3711, 3712 සහ ISSP 24.

(ඇ) ඉඩම් පිහිටි ගම් : අඹන්පොල, නවගත්ත, ගෝනමඩිත්ත, උඩංගාව, රොලව, ගනේ, ගල්ටැංවත්ත, කිවුලේගම, හිරිගොල්ලේගම, කිරිමැටියාව, කඩහතගම, බඹරමිතෝගම, දැතව, කයිරග්ගම, පාලුසිහඹලැව, යකාපලුගස්වැව, අබකොලවැව.

(ඈ) ග්‍රාම නිලධාරි කොට්ඨාස : අංක 187 - අබකොලවැව දකුණ, 188 - කිරිමැටියාව, 189 - අඹන්පොල උතුර, 190 - අඹන්පොල දකුණ, 191 - උඩංගාව, 192 - දැතව සහ 193 - රොලව

(ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : අඹන්පොල

(ඊ) දිස්ත්‍රික්කය : කුරුණෑගල

(උ) අන්සතු කිරීමට ඇති ඉඩම්වල ස්වභාවය : වාණිජ කටයුතු, නේවාසික කටයුතු සහ කෘෂිකාර්මික කටයුතු සඳහා.

(ඌ) අන්සතු කරනු ලබන ඒකකය :
වාණිජ (උපරිම) පර්. 20 (අවම) පර්. 2 1/2
නේවාසික (උපරිම) පර්. 20 (අවම) පර්. 15
කෘෂිකාර්මික (උපරිම) අක්කර 02 (අවම) අක්කර 1

2. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි පහත දැක්වෙන පන්තියට හෝ පන්තිවලට අයත් පුද්ගලයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

- ගොවි පන්තියට අයත් නොවන -

ඉහත සඳහන් පන්තියට හෝ පන්තිවලට තවත් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ලිපිලේඛන ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2014.12.31 වැනි දින හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අඹන්පොල" වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2014.01.15 වැනි දින අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති වන තැනැත්තා පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් සකස් කරන අතර, ඒ සඳහා රජයේ තක්සේරුව මත තක්සේරු කරන මුදල ගෙවිය යුතු ය.

7. ඉඩම් කච්චේරියේ දී තෝරා ගන්නා පුද්ගලයින් සියලු දෙනාම 2008/4 චක්‍රලේඛය යටතේ ලියාපදිංචි වූ පුද්ගලයින් විය යුතු ය.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරි පිළිබඳ විස්තර, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබා ගත හැකි ය.

පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) - පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල.
ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අඹන්පොල.

ජේ. එම්. ආර්. පී. ජයසිංහ,
පළාත් ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2014 නොවැම්බර් මස 10 වැනි දින.
වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දී ය.

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම සඳහා බෙදා දීමට ඇති ඉඩම් වෙනුවෙන් වාණිජ/කෘෂිකාර්මික/නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :—————.
2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
3. (i) ලිපිනය :—————.
   (ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :—————.
   (අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.
   (ආ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.
4. ගෘහ මූලික අංකය :—————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
6. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :—————.
7. උපන් දිනය :—————.
8. විවාහක/අවිවාහක ද යන වග :—————.
9. රැකියාව :—————.
10. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :—————.
11. අයදුම්කරු කලත්‍රයා ඇතුළු පවුලේ මුළු වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |
| (v) | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය).

13. කලත්‍රයා රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :—————.

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය : (තමාගේ ද?/බද්දට ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග) :—————.

15. නිවස පිහිටි ස්ථානය :—————.

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :—————.

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| (i) | | | |
| (ii) | | | |
| (iii) | | | |
| (iv) | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :—————.
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :—————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :—————.

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| (i) | | |
| (ii) | | |
| (iii) | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

—————,
ග්‍රාම නිලධාරීගේ අත්සන.
හා නිලමුද්‍රාව.

නම :—————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

අනු අත්සන් කරමි.

—————,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන
හා නිලමුද්‍රාව.

## දිවුරුම් ප්‍රකාශය

'......................................... දිස්ත්‍රික්කයේ............................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ...................................... ග්‍රාම නිලධාරි වසමේ............................... පදිංචි.............................................. වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මගේ භාර්යාවට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේ ම ඉහත කී අක්කර ................. රූඩ් .................... පර්. .................. පමණක් වූ මෙම ඉඩම පවරා ගැනීමෙන්/මිල දී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, නිවාස දේපළ උපරිම පනත යටතේ සීමාවන් නොඉක්මවන බවටත්, වැඩිදුරටත් මෙයින් ප්‍රකාශ කරමි.

—————,
දිවුරුම්කරු.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

—————,
සාමදාන විනිශ්චයකාරතැන.

## වයඹ පළාත් සභාව

### මහා නගර සභා නියෝග

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289 වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහා නගර සභාවල සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්,
පරිසර, සංචාරක හා ආයෝජන සම්බන්ධීකරණ, සමූපකාර
සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 20 වැනි දින,
කුරුණෑගල දී ය.

#### නියෝග

1. මෙම නියෝග මහා නගර සභාවල සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට අදාළ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. මහා නගර සභාවල සභිකයින් සඳහා සභාවේ විධිමත් යෝජනා සම්මතයකින් රු. 3,000 ක උපරිමයකට යටත්ව සන්නිවේදන දීමනාවක් ගෙවිය හැකිය.

3. මෙම දීමනා සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතුය.

4. *(අ)* පහත සඳහන් අවස්ථාවන්හිදී මහා නගර සභා සභිකයින් සන්නිවේදන දීමනා සඳහා හිමිකම් නොලබයි.

   (i) දීමනා ගෙවීමට අදාළ මාසයෙහි පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගී නොවීම.

   (ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම.

   (iii) වයඹ පළාත් සභාවේ 1991 අංක 01 දරන වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) ප්‍රඥප්තියට අනුව හෝ මහා නගර සභා ආඥා පනතේ 277 වගන්තිය යටතේ යම් මහා නගර සභාවක සභිකයින්ගේ කටයුතු හා කාර්යයන් අත්හිටුවා තිබීම.

   එසේ වුව ද, රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක්වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන් බලා මෙම දීමනා ගෙවනු ලැබිය හැකි ය.

   *(ආ)* මෙම නියෝගයේ (අ) ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභිකයින් රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමකට සහභාගි නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතු ය.

11 - 754/1

## වයඹ පළාත් සභාව

### නගර සභා රීති

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193 වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නගර සභාවල සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට අදාළ රීති මෙයින් පනවනු ලැබේ.

නීතිඥ ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්,
පරිසර, සංචාරක හා ආයෝජන සම්බන්ධීකරණ, සමූපකාර
සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 20 වැනි දින,
කුරුණෑගල දී ය.

#### රීති

1. මෙම රීති නගර සභාවල, සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට අදාළ රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. නගර සභාවල සභිකයින් සඳහා සභාවේ විධිමත් යෝජනා සම්මතයකින් රු. 3,000 ක උපරිමයකට යටත්ව සන්නිවේදන දීමනාවක් ගෙවිය හැකි ය.

3. මෙම දීමනා සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතු ය.

4. *(අ)* පහත සඳහන් අවස්ථාවන්හි දී නගර සභා සභිකයින් සන්නිවේදන දීමනා සඳහා හිමිකම් නොලබයි.

   (i) දීමනා ගෙවීමට අදාළ මාසයෙහි පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගී නොවීම.

   (ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම, හෝ

   (iii) වයඹ පළාත් සභාවේ 1991 අංක 01 දරන වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) ප්‍රඥප්තියට අනුව හෝ නගර සභා ආඥා පනතේ 184 වගන්තිය යටතේ යම් නගර සභාවක සභිකයින්ගේ කටයුතු හා කාර්යයන් අත්හිටුවා තිබීම.

   එසේ වුව ද, රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක්වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන්බලා මෙම දීමනා ගෙවනු ලැබිය හැකි ය.

   *(ආ)* මෙම නියෝගයේ *(අ)* ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභාවක සභිකයින් රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමකට සහභාගි නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතු ය.

11 - 754/2

## වයඹ පළාත් සභාව

### ප්‍රාදේශීය සභා රීති

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභාවල සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට අදාළ රීති මෙයින් පනවනු ලැබේ.

නීතීඥ ජේ. පී. දයාසිරි පත්මකුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්,
පරිසර, සංචාරක හා ආයෝජන සම්බන්ධීකරණ, සමූපකාර
සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 20 වැනි දින,
කුරුණෑගල දී ය.

### රීති

1. මෙම රීති ප්‍රාදේශීය සභාවල, සභිකයින් සඳහා සන්නිවේදන දීමනා ගෙවීමට අදාළ රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභාවල සභිකයින් සඳහා සභාවේ විධිමත් යෝජනා සම්මතයකින් රු. 3,000 ක උපරිමයකට යටත්ව සන්නිවේදන දීමනාවක් ගෙවිය හැකිය.

3. මෙම දීමනා සභා අරමුදලින් ගෙවිය යුතු අතර ඒ සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබිය යුතුය.

4. *(අ)* පහත සඳහන් අවස්ථාවන්හි දී ප්‍රාදේශීය සභාවල සභිකයින් සන්නිවේදන දීමනා සඳහා හිමිකම් නොලබයි.

(i) දීමනා ගෙවීමට අදාළ මාසයෙහි පවත්වන ලද මහා සභා රැස්වීමට සහ කාරක සභා රැස්වීම්වලට මහා සභාවේ අනුමැතියකින් තොරව සහභාගී නොවීම.

(ii) කිසියම් සාපරාධී චෝදනාවකට අදාළව රැඳවුම් භාරයේ හෝ සිරගතව සිටීම, හෝ

(iii) වයඹ පළාත් සභාවේ 1991 අංක 01 දරන වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) ප්‍රඥප්තියට අනුව හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක සභිකයින්ගේ කටයුතු හා කාර්යයන් අත්හිටුවා තිබීම.

එසේ වුව ද, රැඳවුම් භාරයේ සිටි හෝ සිරගතව සිටි හෝ නිවාඩු ලබා සිටි හෝ සේවය අත්හිටුවා සිටි කාලය කිසියම් මාසයකින් කොටසක්වන අවස්ථාවකදී එම මාසයේ ඉතිරි කාලය සඳහා අනුපාතිකව ගණන්බලා මෙම දීමනා ගෙවනු ලැබිය හැකිය.

*(ආ)* මෙම නියෝගයේ *(අ)* ඡේදයේ (i) අනුඡේදයේ කෙසේ සඳහන් වුවද සභිකයින් රාජකාරි කර්තව්‍යයක් සඳහා විධිමත් අනුමැතියකින් යුතුව නිරතවන අවස්ථාවක සභා රැස්වීමකට සහභාගි නොවීම මත ඔහුගේ දීමනා අහිමි නොවිය යුතුය.

11 - 754/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.